# වඩා නිරෝගී බෝග

ලෝකයේ ජීවත් වන බොහෝ මිනිසුන්ට අවශ්‍ය සම්පූර්ණ ආහාර ප්‍රමාණයන් සොයා ගැනීම දුෂ්කර වුවද, ලෝකයේ ජනගහණයට අවශ්‍ය ආහාර නොමැතිකමින් ඇතිවන ඉතා අඳුරු කාල පරිච්ඡේදයන් පිළිබඳව "මැල්තස්" නමැති ආර්ථික විද්‍යාඥයා පළ කල අනාවැකි තවමත් සත්‍යයෙන් තොර සිහිනයකට පමණක් සීමා වී ඇත. එනමුත් ඔහුගේ තර්කයන් මුළුමණින්ම වැරදි නොවේ. ඒ අනුව විශාල වශයෙන් පැතිරී ගිය හැකි සාගතයන් බොහෝ විට මගහැරී ගියේ අළුත් ඉඩම්වල වගාවන් ඇරඹීම හා වැඩි දියුණු කළ නවීන කෘෂිකාර්මික ක්‍රමයන් මගින්, විශාල අස්වනු ලබාගැනීමට පුළුවන් වූ නිසාය. එහෙත් දැනුදු විශාල නිෂ්පාදන ශක්තියක් ඇති ඉඩම් වගා නොවී ඇති අවස්ථාද තිබේ.

අපූරු නව කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමයන් සොයා ගැනීම නිසා අනාගතයේදී ඇතිවන සාගතයන් වළක්වා ගත හැකිවනු ඇත. එමෙන්ම මිනිස් වර්ගයාගේ පෝෂණයට එක එල්ලේම ප්‍රයෝජනවත් නොවන නොයෙක් පැළෑටි වර්ග මිනිසාගේ ප්‍රයෝජනයට ගත හැකි වීම නිසා ද මෙසේ විය හැක. දැනට අපට පුරුදු බෝග වර්ගවලින් අස්වැන්න වැඩි කරගත හැක්කේ එම බෝග යටතේ ඇති අක්කර ප්‍රමාණය වැඩි කරනවා වත් වඩා එම බෝගවල ඇති අස්වැන්න ප්‍රමාණය වැඩි දියුණු කිරීමෙනි. දැනට පාවිච්චි කෙරෙන වර්ගවලට වඩා උසස් අස්වැන්නක් ලබාදෙන නව බෝග වර්ග බෝකර ගැනීම මෙම අරමුණ ඉටුකර ගැනීමේ එක් මගකි. එමෙන්ම නුදුරු අනාගතයේදීම අස්වැන්න වැඩි දියුණු කළ හැක්කේ වඩාත් නිරෝගී වගාවන් ඇති කිරීමෙනි.

පැළෑටිවලටද සතුන්ට මෙන්ම නොයෙක් රෝග සෑදේ. මෙයින් සමහරක් බරපතල ඒවා වන අතර අනික් ඒවා සුළු රෝගයන් වෙති. සමහර රෝග අනිකුත් පැළෑටිවලට ද, බෝවන අතර අනික්වා බෝ නොවේ. බෝවන රෝග ඇති වන්නේ පියවි ඇසට නොපෙනෙන දිලීර, බැක්ටීරියා හා වීරස මගිනි. එනමුදු අස්වැන්න අඩු වීම මෙම ද්‍රව්‍ය කොටස් තුන නිසාම පමණක් සිදු වේයයි නොසිතිය යුතුය. පෝෂණයේ වරදින් මන්ද පෝෂණයෙන් පෙළෙන පැළෑටිවල තත්ත්වය රෝගයන් සේ ගණන් ගතහොත් ඇත්ත වශයෙන් අස්වැන්න අඩුවන්නේ පැළෑටිවල දුර්වල පෝෂණය නිසාමය. කොළ පැහැති පැළෑටිවලට අවශ්‍ය වන්නේ ඉතා වාත් ආහාර වර්ග යන්ය. මේවා නම් සුළඟේ ඇති අංගාරිකාම්ල වායුව (CARBON DIOXIDE) හා පස තුළ ඇති ජලයෙහි දිය වූ මූලික ඛණිජ ද්‍රව්‍යයන්ය. (MINERAL ELEMENTS). එහෙත් සෑම පසකම අවශ්‍ය සියළුම ඛණිජ ද්‍රව්‍ය නොමැති බැවින් ඛණිජ ද්‍රව්‍ය අඩු පොළොවේ පැළෑටි සරුවට නොවැඩේ. එබැවින් සරු වගාවන් ඉක්මණින් ඇති කරගත හැක්කේ පොළොවට රසායනික පොහොර අඩංගු කිරීමෙනි. පැළෑටිවලට සෑදෙන බෝවන රෝගයන් මර්දනය කිරීමෙන් වැඩි වන අස්වැන්නට සමාන අස්වැන්න වැඩි වීමක් කෘමි පළිබෝධකයින් මර්ධනය කිරීමෙන්ද ලැබේ. ඉතාමත්ම නවීන කෘමි නාශක බෙහෙත් වගී ඇති මෙවැනි යුගයක බෝගවලට කෘමීන්ගෙන් හා රෝගයන්ගෙන් කරදර බොහෝ සෙයින් ඇතිවිය යුතු නොවේ.

එහෙත් රෝග මර්ධනයෙන් පමණක් සියළු දෙනාටම ඇතිතරම් ආහාර නිෂ්පාදනය කර ගත හැකි නොවේ. නිරෝගී බෝග වගා කිරීමෙන් අස්වැන්න නිරායාසයෙන්ම වැඩි දියුණු වනු ඇත.

එහෙත් වෙනත් වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රමයන්ගෙන් මෙන්ම රෝග මර්ධනය කිරීමෙන් වුවද, අස්වැන්න වැඩි දියුණු කල හැකි සීමාවක් ඇත. එනමුදු වැඩි වන අස්වැන්නෙන් වැඩිපුර ජනගහනයක් යැපෙනු ඇත. එබැවින් සාගතයන් හා දුර්භික්ෂ සමයන් මගහැරවීමට හෝ කල් දැමීමට නම් ජනගහනය වැඩිවන රටාව වෙනස් කල යුතුය. රෝගයන් මර්ධනය කිරීමෙන් වැඩි වන අස්වැන්න තක්සේරු කිරීමේ ක්‍රමයක් තවම මෙරට නැත. එබැවින් එමගින් රට තුළ වැඩි වන අස්වැන්න ප්‍රමාණය කොතෙක්දැයි නිශ්චය වශයෙන් කිව නොහැක. එමෙන්ම රෝග මර්ධනයේන් වැඩිවන අස්වැන්න ප්‍රමාණ මුළු අස්වැන්න ප්‍රමාණයෙන් අඩක් වේද, නැතහොත් හතරෙන් පංගුවක් වේදැයි හරියාකාර කිව නොහැක.

කෙසේ වෙතත් රසායනික පොහොර දැමීම ආදී නවීන කෘෂිකාර්මික ක්‍රමයන් සමග වගාවන් යටතේ ඇති අක්කර ප්‍රමාණයද, වැඩි වෙත්ම අස්වැන්නද, වැඩි දියුණු කර ගැනීමට නම් රෝග මුළුමණින්ම මර්ධනය කළ යුතුය.

රෝග මර්ධනය කිරීමට ඇති තවත් අඩු පාඩුවක් නම් ඒ පිළිබඳ විශේෂඥයන් හිඟ කමයි. ලෝකයේ බොහෝ උගත් අය පරමාණු බෝම්බ, ජෙට් ගුවන් යානා සාදනවා විනා පැළෑටිවල ඇති ලෙඩ රෝග පිළිබඳ සැලකිල්ලක් නොදක්වති. එබැවින් අපේ රටේ වුවද, තෘණ විද්‍යාව, ජීව විද්‍යාව, හා කෘෂිකර්මය උගත් අයට දැනට වඩා විශාල පහසුකම් සලසා විශේෂ පුහුණුවක් ලබා දිය යුතුය. මනුෂ්‍යයාට ප්‍රීතිමත් අවස්ථාවක් ලබා දීම, ගමන් කිරීමේ පහසුකම් සලසාදීම, යුද්ධ කිරීමට පහසුකම් සැලසීම, ආදී කටයුතු පිළිබඳ පර්යේෂණයන් කිරීම පිළිබඳ බොහෝ විද්‍යාඥයින්ගේ මනැස යොමු වී ඇති අතර අපට ආහාර සපයා දෙන පැළෑටිවලට සෑදෙන ලෙඩ රෝග පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට මිනිසා එතරම් සැලකිල්ලක් නොදක්වයි. මේ ක්‍රමය විගාම වෙනස් කළ යුතු වන්නේය. අපේ රටේ-වෛද්‍ය කර්මය හා සනීපාරක්ෂා ක්‍රම මනා ලෙස ක්‍රියාවේ යෙදීම නිසා මිනිසුන් ජීවත්විය හැකි සාමාන්‍ය කාල සීමාව වැඩි වී ඇත. නවීන වෛද්‍ය කර්ම, සනීපාරක්ෂා ක්‍රම යෙදීමෙන් අපි අපේ රටේ ජනගහණය කෝටි ගණනකින් අපේ වුවමනාවටම වැඩි කරගෙන ඇත. එහෙත් ඊට සරිලන සේ නවීන කෘෂි කාර්මික ක්‍රමයන්ද ක්‍රියාවේ යොදා එම අතිරේක ජනගහණයට අවශ්‍ය ආහාර නිපදවා නොගැනීමෙන් අපි කළේ, මෝඩකමක් නොවේද? කුඩා කාලයේ රජයේ වියදමින් බෝවන රෝගවලින් මුදවාගෙන ජීවිත ආරක්ෂා කරන පරම්පරාවක් වැඩි හිටියන් වූ කල ආහාර නොමැතිව හාමතේ දුක් විඳී නම් එම තත්ත්වයට තුඩු දෙන ආර්ථික පදනම වහා වෙනස් කළ යුතු නේද? එබැවින් වෛද්‍ය කර්මයේ හා ඉංජිනේරු ශිල්පයේ යෙදී ඇති අයට දී ඇති පහසුකම් කෘෂි කර්මය වෘත්තියක් වශයෙන් තෝරාගත් අයටත් දිය යුතුය. එවිට වඩාත් ඥානවන්ත උගත් පිරිසක් පාසැල්වලින් කෘෂිකර්ම ලෝකයට ඇදී එනවා ඇත. එවිට සිදුකෙරෙන වඩා හොඳ පර්යේෂණ ක්‍රම ආදිය මගින් බෝගවල ලෙඩ රෝග වළක්වා වඩා හොඳ අස්වනු නොකඩවා ලබා ගැනීමට අපට පුළුවන් වෙනවා ඇත.

විෂබීජ නාශක ද්‍රව්‍ය සොයා ගැනීම, කෘමි නාශක බෙහෙත් යෙදීමේ ක්‍රම සොයා ගැනීම, රෝගයන්ට ඔරොත්තු දෙන වර්ග සොයා ගැනීම, ආදී නවීන ක්‍රමයන් සොයාගත හැක්කේ පර්යේෂණයන් මගිනි. එබැවින් බොහෝ උගත් විද්‍යාඥයින් වැඩි වැඩියෙන් අපට අවශ්‍ය වී ඇත.

නව ක්‍රම සොයා ගන්නා අතර සොයාගෙන ඇති ක්‍රම සාර්ථක ලෙස ක්‍රියාවේ යෙදීමටද, විද්‍යාඥයින් අවශ්‍යය. අපේ බොහෝ ගොවියෝ සමහර විට නොදැනුවත්කම නිසාදෝ පැළෑටිවලට වැළඳී ඇති රෝග ඉතා තදබල වී උත්සන්න වනතුරු කිසිදු ප්‍රති කර්මයක් හෝ ප්‍රතිකාරයක් නොකර බලා සිටිති. මෙවැනි අවස්ථාවලදී රෝග නිසියාකාර හඳුණන විද්‍යාඥයින්ගේ මගපෙන්වීම අවශ්‍ය වෙයි. තේ බිබිලි රෝගය, දෙඩම් "ට්‍රිස්ටෙසා" රෝගය, කොකෝවා කඳ ඉදිමීමේ රෝගය, රබර් fපයිටොප්තරා රෝගය, වී කොළපාළු රෝගය, පොල් ගොබය කුණුවීමේ රෝගය, මිරිස් කොළ කොඩවීමේ රෝගය ආදී රෝග රටක ආර්ථික තත්ත්වයට කෙතරම් හානියක් සිදු කරයිද? එමෙන්ම පැපොල්වලට මෑතක සිට වැළඳී ඇති වීරස රෝගයට නියම ප්‍රති කර්ම වහ වහා නොයෙදුවොත් රටේ පැපොල් අස්වැන්න අඩුවීයාමේ දුඃඛිත තත්ත්වයක් ඇත නැගීමට ඉඩ තිබේ. එබැවින් තම තමන්ගේ ගෙවතුවලින් මෙම රෝගයන් තුරන් කරලීම කාගේත් පරම යුතුකම වන්නේය.

පළමුවෙන් දැනට ගෙවතුවල වගා කෙරෙන රෝගී පැළ ද්‍රව්‍ය වෙනුවට ගොවිපළවලින් නිරෝගී පැළ ද්‍රව්‍ය මහජනයාට සැපයිය යුතුය. විශේෂයෙන්ම ලෙඩ රෝග ඇද්ද? නැද්ද? යනු සොයාගත නොහැක්කේ වීරස රෝග යන් පිළිබඳවය. එබැවින් වීරස රෝගයන් ගෙන් තොර, දෙඩම්, පැපොල්, මිරිස් ආදී බෝගයන්ම ගොවිපළවල් තුළ වෙබාලා යුතුය. වීරස රෝගයන් ඇති ස්ථානවල වර්ධක ප්‍රජනන ක්‍රමයට පැළ බෝකිරීම අත් හිටුවා ඇට වලින් පමණක් පැළ බෝකළ යුතු වෙයි. තවද, බොහෝ රෝග බෝවන්නේ ඇට වර්ග මාර්ගයෙන් බැවින්, ඇටවල විෂබීජ නාශණය

හා බීජ සහතික කිරීමේ ක්‍රමයන්ද, අපට අවශ්‍ය වී ඇත. රෝගවලින් තොර වගාවන් ඇති කර ගැනීම උදෙසා තම තමන් සිටුවීමට ගන්නා බීජවලට දිලීර නාශක බෙහෙත් ද්‍රව්‍ය යෙදීමට අපි හැමෝම සිතට ගත්තොත් හොඳයි.

වගාවලින් රෝග තුරන් කරලීමට අවශ්‍ය කරුණු අතර රෝගවලට ඔරොත්තු දෙන වර්ග වගා කිරීම, බීජවල විෂබීජ නාශකය. වීරස වලින් තොර පැළ ද්‍රව්‍ය සැපයීම ආදිය, පමණක් ක්‍රියාවේ යෙදීමෙන් සාර්ථක ප්‍රතිඵල නොලැබේ. රෝග මර්ධන ක්‍රමද, ක්‍රියාවේ යෙදිය යුතුය.

එනමුත් රෝග මර්ධන ක්‍රම පිළිබඳව උපදෙස් දීමෙන් පමණක් පලක් ඇති නොවේ. සිය දෙනෙකුට දෙන උපදෙස්වලින් නිසි ප්‍රයෝජන ගන්නේ ඉතා ස්වල්ප දෙනෙකි. එබැවින් රෝග මර්ධන ක්‍රම නිසියාකාර ක්‍රියාවේ යෙදීමට නම් ඒවා නීති මගින්ද, ක්‍රියාත්මක කළ යුතුය. මහා බ්‍රිතාන්‍යයේ අර්තාපල් රෝග වළක්වාලීම පිණිස නීති පැනවීමෙන් පසු රෝග සාර්ථක ලෙස මර්ධනය කොට ඇත. එම නීති මාලාවේ අඩංගු එක් නීතියක් නම් රෝගී අර්තාපල් අල එක පළාතක සිට අනෙක් පළාතකට ගෙන යෑම නීති මගින් තහනම් කිරීමයි.

දුම්බර මිටියාවතෙන්ද රෝගී කොකෝවා දඬු ගෙනයාම නීතිමගින් තහනම් කොට ඇත. එමෙන්ම නීති තිබීමෙන් පමණක් පලක් ඇති නොවේ. ඒවා කාටත් සර්ව සාධාරණ ලෙස ක්‍රියාත්මක කළ යුතුද වෙයි. අපේ රටේ කෙසෙල්වල වද පිදීමේ රෝගය වළක්වා ලීමට නීතියක් ඇති නමුදු එම නීතිය ක්‍රියාත්මක නොවේ. මෙවැනි ක්‍රියාත්මක නොවන නීතිවලින් රටට වැඩදායක කිසිවක් සිදු නොවේ. එබැවින් පැපොල් වීරස රෝගයට දැන් නීතියක් ක්‍රියාත්මක කළොත් අගේයයි හැඟේ. රෝගය පැතිරී ගොස් විශාල කරදරයක් වූ පසු නීති ක්‍රියාත්මක කිරීමක් අවශ්‍ය නොවන බැවිනි. රෝග මර්ධනය කිරීමේ ඉතා හොඳ මගනම් රෝග බෝ වූ මුල් අවධියේම මර්ධනය කර ගැනීමයි.

විසරිය රෝගයෙන් පෙළෙන අයෙක් ඔබේ නිවස තුළ සිටිනවාට ඔබ සතුටුද? එමෙන්ම ඔබේ ගෙවත්තේ හෝ ගොවිපළේ බෝවන රෝගයක් ඇති පැළෑටියක් තිබෙනු දක්මටද ඔබ අකමැති විය යුතුය. එසේ ඔබ කැමැත්තෙන්ම බෝවන රෝගයක් ඇති පැළෑටියක් ඔබේ ගොවිපළේ තිබෙන්නට ඉඩ හැරියොත් නුදුරු අනාගතයේදී ඔබේ මුළු ගොවිපළම විනාශ වී යනවා ඇත. ගොවිපළ තුළ ශෂ්‍ය මාරු ක්‍රමයට වෙනත් වෙනත් බෝග වර්ග වගා කිරීමෙන්ද පැළෑටි රෝග බොහෝ දුරට වළක්වා ගත හැක. සතුන්ට එක්වරක් බෝ වන රෝගයක් වැළඳුණ හොත් එම රෝගය කෙරෙහි ඔරොත්තු දීමේ ශක්තියක් එම සතාට ඇති වුවද, පැළෑටිවල එසේ නොවේ. පැළෑටිවලට එකම රෝගය දිගින් දිගටම සෑදේ. එබැවින් හොඳ ගොවියෝ තම බෝග ආරක්ෂා කර ගැනීම සඳහා රෝග ඇති වුවද, නැති වුවද කන්නයක් තුළ බෝගයේ නොයෙක් අවස්ථාවලදී සිරිතක් වශයෙන්ම බෙහෙත් යොදති.

සෙම්ප්‍රතිශ්‍යාව, සරම්ප, පැපොල් රෝගය වැනි වීරස මගින් මිනිසුන්ට බෝ වන රෝග සෑදී ටික කලකින් ශරීරය එම වීරසය මැඩ පවත්වා ඒවායින් පසු රෝගය සුව වී එය එම ශරීරයේ තිබූ බවක් වත් දැන ගැනීමට නුපුළුවන. එහෙත් පැළෑටියකට එවැනි වීරස රෝගයක් වැළඳුණ විට පැළෑටියට එම වීරසය මැඩ පවත්වා ගැනීමට නොහැකි වීම නිසා පැළෑටිය මැරෙණ තුරුම වීරසය පැළෑටියේ තිබේ. එබැවින් බොහෝ විට මෙවැනි රෝග බෝවූ ගස් එම රෝග නිසාම මරණයට පත් වෙති. එමෙන්ම වර්ධක ප්‍රජනන ක්‍රමයක් මගින් පැළෑටි කොටස්වලින්ම එම පැළය බෝ කළොත් වීරස රෝගයද, පරම්පරාවෙන් පරම්පරාවට යයි. මෙවැනි රෝගයන් තම ගෙවතු හා ගොවිපළවල් තුළින් ඉවත් කිරීම සමාජයට කරන විශාල සේවයකි. දැනට ලෝකයේ පිළිගත් සමහර කෘෂිකාර්මික මතයන් නිසාද, වීරස රෝග බෝ වීම වැඩි වී ඇත. වගාවේ ඒකාකාර සවභාවයක් ලබා ගැනීම උදෙසා වර්ධක ප්‍රජනන ක්‍රමයන් මගින් පැළෑටි කොටස්වලින්ම පැළ බෝ කිරීම නිසා වීරස රෝග වැඩි වී ඇත. පසගිය ශත වර්ෂය තුළ ලෝකයේ සෑම රටක්ම වාගේ පැළ හුවමාරු කර ගත් බැවින් රට රටවලට අපූරු නව වීරස රෝග බෝවී ගොස් ඇත. එක් පැළෑටියක් තුළ ඇති වීරසයෙන් එම පැළෑටියට කිසිදු රෝගයක් ඇති නොවුවද, අසල ඇති වෙනත් පැළයකට එම වීරසය සංක්‍රමණය වුවොත්, භයානක රෝගයක් ඇති වීමට ඉඩ

ඇත. එබැවින් "ක්වරන්ටයින්" ක්‍රමවලින් වීරස රෝග වැළැක්විය නොහැක. ඇත්ත විශයෙන්ම කිසිදු වීරස රෝගයක් දක්නට නොලැබෙන පැළෑටි වර්ගයක් රට තුළට ගෙන්වීම නිසා නව රෝගයක් බෝ වී යෑමට ඉඩ තිබේ. එබැවින් වීරස රෝග, මැඩ පැවැත්වීමට තවත් බොහෝ පර්යේෂණ පැවැත්විය යුතුය. දිනට දන්නා කරුණු අතර බොහෝ වීරස රෝග එක් පැළෑටියකින් තවත් පැළෑටියකට බෝ වන්නේ කෘමීන් මගින්. එබැවින් කෘමිනාශක බෙහෙත් මෙම පැළෑටිවලට විදීමෙන් එම පැළෑටිවලට පැමිණෙන කෘමීන් විනාශ කිරීමේ ක්‍රම විද්‍යාඥයෝ සොයා ගෙන ඇත. එමෙන්ම වීරස රෝගයන්ට ඔරොත්තු දෙන වර්ගයන් වගා කිරීමද, රෝග ජය ගැනීමේ එක් මගකි. එහෙත් එක් වීරස රෝගයකට ඔරොත්තු දෙන නව පැළෑටි වර්ගයක් බෝ කොට එම වර්ගය කලක් තිස්සේ වගා කෙරෙන විට එම වීරස රෝගයම බෝ කරන වෙනත් වීරස වර්ග ඇතිවන බැව් සොයාගෙන ඇත. එවිට අලුත් වීරස මගින් රෝගය ඔරොත්තු දෙන පැළෑටි වර්ගයට එම රෝගය ම බෝවී යෑම නිසා පැළෑටියේ ඔරොත්තු දීමේ ශක්තියද නැති වූ අවස්ථා දැන ගන්නට ඇත. එබැවින් ඔරොත්තු දෙන එක් පැළෑටි වර්ගයක් බෝ කිරීම රෝගය ජය ගැනීමේ තාවකාලික මගක් මිස සදුකාලික ක්‍රමයක් නොවේ.

ඔරොත්තු දෙන නව වර්ග බෝ කරන තුරු අපට පුළුවන් වන්නේ වීරසය ඇති අනිකුත් ප්‍රයෝජනයක් නොමැති වල් පැළෑටි වගාවලින් තුරන් කිරීම හා දුටු තැන විනාශ කිරීමේ ක්‍රම යෙදීමයි. එමගින් නව වීරස ප්‍රභේද බෝ වී යෑමද වැළකීම නිසා රෝගයන්ට ඔරොත්තු දෙන වර්ගයන්ගේ රෝග ප්‍රතිශක්තියද. වැඩිකල් පවතිනවා ඇත. ඉහත කී ක්‍රමය වීරස රෝගයන්ට පමණක් නොව බැක්ටීරියා හා අනිකුත් දිලීර රෝගයන් පිළිබදවද, එසේමය. කෙසේ වෙතත් වගාව තුළ වඩා හොඳ සනීපාරක්ෂක කටයුතු යෙදීමෙන් රෝග අඩු වෙයි. රෝගී මිනිසුන්ගෙන් තද බදවූ තැනෙක මිනිස් මලකාණු ද, කුණු වෙමින් දුගඳ හමමින් තිබේ නම් එතැන ඇති සනීපාරක්ෂාව ගැන කුමන කථා ද? එමෙන්ම නියම පරතරයක් නොතබා වගාවල මැරුණු පැළෑටි. වල්පැළෑටි. කෘමීන් හා රෝගී පැළෑටි ආදියද ගොඩ ගැසී ඇත්නම් එතැනද පෙර කී තැන සේමය.

ලෝකයේ ආහාර හිඟයක් පිළිබඳව කෙරෙන සාකච්ඡාවලදී වැඩියෙන් ආහාර ඇති රටවලින් ආහාර හිඟ රටවල්වලට ආහාර සැපයීමේ ක්‍රමයන් තීරණය කර ගනිති. එහෙත් මෙය සදුකාලික ප්‍රතිකර්මයක් නොවේ. තමනට මුදලින් වාසියක් නොමැති කල දිගින් දිගටම දුර්වල රටවල්වලට ආහාර සැපයීමට දියුණු රටවල් අකමැති වෙති. එබැවින් මෙය දුර්වල රටවල් ආහාර අතින් ස්වයංපෝෂිත භාවය ලඟා කරගන්නා තුරු යොදන තාවකාලික පිළියමක් පමණි. තවද, මෙවැනි ආධාර ක්‍රමයන් යටතේ ආහාර හා බෙහෙත් යන දෙවර්ගයම ආධාර වශයෙන් දීමෙන් දුර්වල රටතුළ ඇති ප්‍රශ්න තවත් උග්‍ර වෙයි. එනම් ආධාර වශයෙන් දී ඇති බෙහෙත් පාවිච්චි කිරීම නිසා මරණ සංඛ්‍යාව අඩු වීමෙන් ජනගහණය වැඩි වීම නිසා ආහාර හිඟය තව තවත් වැඩි වෙයි. එබැවින් දියුණු රටවල් කළ යුත්තේ ආහාර හා ඖෂධ සැපයීම පසෙකින් තබා ඒ වෙනුවට කාර්මික ඥානය හා රටතුළ නිෂ්පාදනය වැඩි කිරීමට ක්‍රම සැලසීම හා ඒවාට ආධාර කිරීමයි. ආහාර හිඟ මෙරට නිෂ්පාදන ශක්තිය වැඩි කිරීමට ඉඩ කඩ එමට තිබේ. එබැවින් එක් අක්කරයකින් එක් මනුෂ්‍යයෙක් සඳහා නිපදවිය හැකි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අපේ රටේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ ඒකායන මාර්ගයයි. එතෙක් උත්පත්ති පාලනය කිරීමටද මිනිසුන් නොපෙළඹෙනවා ඇත.

එබැවින් අපේ රටේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ එක් මගක් නම් නිරෝගී පැළෑටි වගා කිරීමයි. රසායනික පොහොර යෙදීමෙන් පැළෑටිවල පෝෂණ අඩුලුහුඩුකම් නැති කිරීමෙන්ද රටේ මුල් බැසගත් රෝග මර්දන ක්‍රම ක්‍රියාවේ යෙදීමෙන්ද, මෙය අපට ඉටු කළ හැකිය.

මුදලත් පරිශ්‍රමයත් නොමැතිව අස්වැන්න වැඩි දියුණු කළ නොහැක. ආහාර අතින් ස්වයංපෝෂිත භාවය ලබා ගැනීම පිළිබඳව ආර්ථික විද්‍යාඥයෝ නොයෙකුත් මත පහළ කරති. අපේ රටේ යුද්ධ හමුදුවක් ඇත්තේ රට සතුරු උපද්‍රවවලින් මුදවා ගැනීමට ය. එහෙත් සාගතය නමැති සතුරාගෙන් බේරීමට උපක්‍රම යෙදීම මීට වඩා වටින්නේය. ආහාරයෙන් සකිත මදින ලංකාව එවිට සතුරු ආක්‍රමණයන්ගෙන්ද තොර වනවා ඇත.

නිමි.